# රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
# பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
# Ministry of Public Administration and Management

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | *Independence Square, Colombo 07, Sri Lanka*

දුරකථනය / தொலைபேசி: **(94) 011- 2694560** / Telephone

ෆැක්ස් / தொலைநகல்: **(94) 011- 2692254** / Fax

ඊ-මේල් / மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk** / E-mail

වෙබ් අඩවිය / இணைத்தளம்: **www.pubad.gov.lk** / Web Site


---

මගේ අංකය / எனது இல / My No: R/3/3/2016

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2017.10.31

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත හා සීමිත තරග විභාග - 2016</u>**

උක්ත තරග විභාගයන්හි ප්‍රතිඵල මත රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම හා බැඳේ.

02. මීට පෙර ද දැනුවත් කර ඇති පරිදි රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට බඳවා ගනු ලබන තනතුරු සංඛ්‍යාව තීරණය කරනු ලබන්නේ ආයතන විසින් මෙම අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ පවත්වාගෙන යන PACIS මෘදුකාංගයේ යාවත්කාලීන කරනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කරගැනීමෙනි.

03. මේ වනවිට බොහෝ ආයතන විසින් පුරප්පාඩු සම්බන්ධ තොරතුරු යාවත්කාලීන කර ඇති නමුත් සමහර ආයතනයන්හි පවතින පුරප්පාඩු ගණන මෙතෙක් යාවත්කාලීන කර නොමැත. මේ වන විට ඒකාබද්ධ සේවයේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය තුළ පවතින සියලුම පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණ කිරීමට තීරණය කර ඇති අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලබාගැනීමට සත්‍ය වශයෙන් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව කඩිනමින් නිර්ණය කළයුතු වේ.

04. ඒ අනුව සියලුම ආයතන විසින් 2017 නොවැම්බර් මස 08 වන දින සවස 4.00ට පෙර පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව PACIS මෘදුකාංගයේ යාවත්කාලීන කරන ලෙස කාරුණිකව දන්වමි. තොරතුරු යාවත්කාලීන කිරීමේදී හා මෘදුකාංගය භාවිතා කිරීමේදී ඇතිවන ගැටලු සහ අදාළ මුරපදය සම්බන්ධව ගැටලු වෙතොත් පහත සඳහන් සම්බන්ධීකරණ නිලධාරීන් අමතා විසඳාගත හැකි බව දන්වමි.

**තොරතුරු යාවත්කාලීන කිරීමේ ගැටලු:**

- එල්.එච්.එල්.දිනුෂ්කා මිය - දුරකථන අංක - 011-2696211 (දිගුව - 606)
- එස්. වාලිනි මෙය - දුරකථන අංක - 011-2696211 (දිගුව - 611)

**මෘදුකාංගය සම්බන්ධ තාක්ෂණික ගැටලු:**

- රංජිත් දිසානායක මයා - දුරකථන අංක - 071-5253192, 011-2696211 (දිගුව - 611)
- එන්.එම්. මුතුමාල මයා - දුරකථන අංක - 071-2865169, 011-2696211 (දිගුව - 611)

05. තවද නව බඳවා ගැනීම සඳහා 2017.11.08 දිනට පවත්නා මුළු පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කරගන්නා බවත්, එදිනට පසුව කරනු ලබන යාවත්කාලීන කිරීම් සහ කිසිදු විමසීමක් සම්බන්ධයෙන් සලකා නොබලන බවත්, එසේ යාවත්කාලීන නොකරන ලද ආයතනවල පුරප්පාඩු නොමැති සේ සලකා ක්‍රියාකරන බවත් වැඩිදුරටත් දන්වා සිටිමි.

කේ.වී.පී.එම්.ජේ. ගමගේ

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්